# විදේශ ආක්‍රමණ හමුවේ සිංහලයන්ගේ සංග්‍රාමීය දක්ෂතා
## (අනුරාධපුර පොළොන්නරු යුග ඇසුරින්)

**පී.එම්.යූ.ප්‍රේමරත්න**[1]

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානයක පිහිටීම නිසා වරින්වර මෙරටට ආක්‍රමණ එල්ල වූ බව පෙනෙන්නට තිබේ. ඒ අතර නිරන්තරයෙන් ලංකාවට ආක්‍රමණ එල්ල වූයේ දකුණු ඉන්දියාවෙනි. අසේළ රජු කල සිදු වූ එළාර ආක්‍රමණය, පස්වන මිහිඳු රජු කල එල්ල වූ පළමුවන රාජ රාජ, රාජේන්ද්‍ර චෝළ ආක්‍රමණ මේ අතර විශේෂයෙන් කැපී පෙනෙයි. ඒ අනුව මේවාට මුහුණ දීම සඳහා නිතැතින් ම සිංහලයෝ සංග්‍රාමයේ දක්ෂ වූහ. මෙම අධ්‍යයනයේදී විමර්ශනයට භාජනය කෙරෙන්නේ විදේශ ආක්‍රමණ හමුවේ පැරණි සිංහලයන් දැක්වූ සංග්‍රාමීය දක්ෂතා මොනවා ද යන්න යි. **පර්යේෂණ ගැටලුව** වූයේ ඒ පිළිබඳ පරීක්ෂා කිරීම යි.

සිංහලයන් තුළ පැවති සංග්‍රාමීය දක්ෂතා හඳුනාගැනීම, එම දක්ෂතාවන්හි සුවිශේෂීත්වය, සටන් කිරීමේදී භාවිත කළ ශිල්පීය ක්‍රම යනාදිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ **අරමුණ** යි.

එහිදී විශේෂයෙන් ම ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු වූ අතර ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කරමින් නිරවද්‍ය දත්ත රැස් කරන ලදී. ඒ අනුව සංග්‍රාමයකට සූදානම් වීමේ තැන් සිට එය දියත් කර අවසානය දක්වා කරුණු විමර්ශනය කිරීම තුළිනුත්, අනපේක්ෂිත අවස්ථාවන්හි එල්ල වූ ආක්‍රමණ සඳහා සිංහලයා මුහුණ දුන් ආකාරය විමර්ශනය කිරීම තුළිනුත් සිංහලයන්ගේ සංග්‍රාමීය දක්ෂතා පිළිබඳ ව අනාවරණය කර ගැනීමට හැකි විය.

ඒ අනුව මෙහිදී එළඹි නිගමන කිහිපයකි. එනම්, මෙරට රජවරු සතුරු ආක්‍රමණයන්ට මුහුණ දීම සඳහා ආරක්ෂක හමුදා සූදානම් කර තබා තිබේ. බල සේනාවන්හි චිත්ත ධෛර්යය සහ සතුට වර්ධනය වන ලෙස මෙරට රජවරු කටයුතු කර තිබේ. බෞද්ධ රටක් වූ හෙයින් විෂ පෙවූ ආයුධ භාවිත කර නැතත් ඒවාට මුහුණ දීම සඳහා යම් යම් උපක්‍රම භාවිත කර තිබේ. එමෙන් ම දක්ෂ රහස් ඔත්තු සේවාවක් ද පවත්වාගෙන ගිය බවට නිගමනය කළ හැක ය. සමස්තයක් වශයෙන් ගත් කල විවිධ ආක්‍රමණිකයන්ට මුහුණ දුන්න ද සිංහලයන් තුළ පැවති මෙම යුදමය කෞශල්‍යය නිසා නැවතත් නිදහස් රටක් වශයෙන් ඉදිරියට ඒමට ඔවුන්ට හැකි වූ බවත් අවසාන වශයෙන් **නිගමනය** කළ හැකි ය.

**ප්‍රමුඛ පද** - සංග්‍රාමය, උපක්‍රම, ආයුධ, ආක්‍රමණ

[1] **ඉතිහාස අංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, manjuhis88@gmail.com**